# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,493 - 2007 අප්‍රේල් 12 වැනි බ්‍රහස්පතින්දා - 2007.04.12

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | – | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 317 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 316 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 318 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 අප්‍රේල් මස 20 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 අප්‍රේල් මස 05 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# බඩු බාහිරාදිය විකිණීම්

## අනුරාධපුර මහාධිකරණය - ප්‍රසිද්ධ භාණ්ඩ වෙන්දේසිය

අනුරාධපුර අධිකරණ සංකීර්ණය අලුත්වැඩියා කිරීමේ දී ගලවා ඉවත් කරන ලද, පහත සඳහන් භාණ්ඩ, 2007.0428 වෙනි සෙනසුරාදා දින පෙ.ව. 9.30 ට අනුරාධපුර මහාධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව, වෙන්දේසි දින පෙ.ව. 9.00 සිට වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍ය මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

03. අධිකරණය විසින් තීරණය කරන ලද අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී, අධිකරණයේ අභිමතය පරිදි, එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව ඇත.

04. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් එවේලේම මුදල් ගෙවා, ප.ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

05. වෙන්දේසියෙන් මිල දී ගන්නා ලද ද්‍රව්‍යයන් සඳහා ගැනුම්කරු විසින්, තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

06. වෙන්දේසිය පිළිබඳව පැමිණිලි කිසිවක් වෙතොත්, එදින වෙන්දේසියේ රාජකාරි අවසන් වීමට පෙර අධිකරණය වෙත දැන්විය යුතු අතර, පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

07. මෙම භාණ්ඩ වෙන්දේසිය පිළිබඳව සියලු කටයුතු, අධිකරණයේ අභිමතය පරිදි සිදු කරන බව වැඩිදුරටත් සඳහන් කරමි.

මහාධිකරණ විනිසුරු, අනුරාධපුර.

2007 මාර්තු මස 26 වෙනි දින,
අනුරාධපුර මහාධිකරණයේ දී ය.

| *අනු අංකය* | *භාණ්ඩ පිළිබඳ විස්තරය* |
|---|---|
| 01. | ටියුබ් ලයිට් 15 යි |
| 02. | අබලන් විදුලි පහන් ආවරණ 68 යි |
| 03. | ටියුබ් ලයිට් බල්බ් (අඩි 4) 73 යි |
| 04. | ටියුබ් ලයිට් බල්බ් (අඩි 2) 03 යි |
| 05. | විදුලිපංකා එල්ලන බට 30 යි |
| 06. | භාෂණ පරිවර්තක වේදිකාව 01 යි |
| 07. | සිවිලින් විදුලි පංකා (තටු සහිත) 16 යි |
| 08. | සිවිලින් විදුලි පංකා (තටු රහිත) 22 යි |
| 09. | විදුලිපංකා තටු 56 යි |
| 10. | අඩි 3 x 3 විදුරුකැලි (කැඩී ඇත) 02 යි |
| 11. | පාවිච්චි කරන ලද වයර් කැලි තොගයක් |
| 12. | නාන කාමර කණ්ණාඩි 02 යි |
| 13. | නාන කාමර කණ්ණාඩි (කැඩුන) 02 යි |
| 14. | අහල් 8 x 10 වීදුරු කැලි 15 යි |
| 15. | විවිධ ප්‍රමාණයේ ඇස්බැස්ටෝස් ෂීට් (සමහරක් කැඩී ඇත) 715 යි |
| 16. | මුදුන් උලු කැට 358 යි |
| 17. | විවිධ ප්‍රමානයේ වැසිදිය බස්වන නළ (කැඩී බිඳී ගිය) තොගයක් |
| 18. | කැඩී බිඳී ගිය ෂීට් කැබලි තොගයක් |

| *අනු අංකය* | *භාණ්ඩ පිළිබඳ විස්තරය* |
|---|---|
| 19. | පිහිලි තහඩු කැබලි 03 යි |
| 20. | වීදුරු තහඩු (කැඩී ඇත) 03 යි |
| 21. | කැඩුනු වැහිදිය බස්වන නළ 12 යි |
| 22. | කැඩුනු වැහි පිහිලි 26 යි |
| 23. | උලු කැට 4165 යි |
| 24. | ජී. අයි. බට අහල් 1/2 7 යි අහල් 01 බට 05 යි |
| 25. | වීදුරුදොරවල් 15 යි |
| 26. | ලෑලි දොරවල් 14 යි |
| 27. | ලෑලි අල්මාරියක් කැඩුනු කෑලි 11 යි |
| 28. | උලුවහු කඳන් 14 යි |
| 29. | ෆෑන් ලයිට් 02 යි |
| 30. | උලවහු 14 යි |
| 31. | කබා රඳවන 01 යි (කෑලි 04 ට කැඩී ඇත) |
| 32. | ජනෙල් රාමු 01 යි |
| 33. | රෙගියුලේටර් 24 යි |
| 34. | විදුලි පහන් ස්විච් 28 යි |
| 35. | ප්ලග් 02 යි |
| 36. | ට්‍රිප් ස්විච් බෝඩ් 2 + 1 |
| 37. | මේන් ස්විච් 02 යි |
| 38. | පියුස් බෝඩ් 01 යි |
| 39. | ප්‍රධාන ස්විච් බෝඩ් පුවරු 01 යි |
| 40. | ෆෑන් කප් 03 යි |
| 41. | අතසෝදන බේසම් 09 යි (පිඟන් මැටි) |
| 42. | කොමඩ් 06 යි (පිඟන් මැටි) |
| 43. | දිය රැඳවීම් 14 යි (පිඟන් මැටි) |
| 44. | වැසිකිලි පෝච්චි 01 යි (පිඟන් මැටි) |
| 45. | මුත්‍රා පෝච්චි 04 යි (පිඟන් මැටි) |

04-251

---

## මහේස්ත්‍රාත් අධිකරණය - කෑගල්ල

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. කෑගල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් ද්‍රව්‍ය 2007.04.28 වෙනි දින පෙරවරු 10.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව හිමිකම් දන්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකටවත් කලින් ස්වකීය හිමිකම් ඉදිරිපත් කල යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හිදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එවේලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියළුම ගෙවීම් මුදලින් කල යුතු අතර චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිලදීගනු ලබන සෑම අයෙකුම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යය වන අතර මිලදී ගන්නා භාණ්ඩ සියල්ල එදින ප.ව. 4.00ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

ඩබ්. වයි. එස්. ප්‍රනාන්දු
මහෙස්ත්‍රාත් කෑගල්ල.

2007 මාර්තු මස 20 වෙනි දින දීය.

### උපලේඛනය

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 01. | ඒ.ආර්. 242 | පාපැදි 1 යි |
| 02. | ඒ. ආර්. 243 | පාපැදි 1 යි |
| 03. | ඒ. ආර්. 504 | පාපැදි 1 යි |
| 04. | ඒ. ආර්. 505 | පාපැදි 1 යි |
| 05. | ඒ. ආර්. 528 | වාහන කැසට් රෙකෝඩර් 1 යි |
| 06. | ඒ. ආර්. 529 | රබර් සෙරෙප්පු ජෝඩු 3 යි |
| 07. | ඒ. ආර්. 530 | විදුලි මෝටර් 1 යි (අබලි) |
| 08. | ඒ. ආර්. 2623 | පාපැදි 2 යි |
| 09. | 31166 | සෙරෙප්පු සහිත පෙට්ටියක් |
| 10. | 49674 | බාල්දි 1 යි |
| 11. | 52541 | බාල්දි 1 යි |
| 12. | 55057 | බාල්දි 1 යි |
| 13. | 57166 | බැරල් 4 යි |
| 14. | 58023 | බාල්දි 1 යි |
| 15. | 58083 | ප්ලාස්ටික් වතුර බෝතල් 1 යි |
| 16. | 58118 | යකඩ බැරල් 1 යි |
| 17. | 58221 | කුඩා ප්ලාස්ටික් කෑන් 1 යි |
| 18. | 59501 | බාල්දි 1 යි |
| 19. | 59502 | බාල්දි 1 යි |
| 20. | 59503 | සවල් 1යි/තාච්චි 1යි |
| 21. | 59517 | බාල්දි 1 යි |
| 22. | 59646 | බාල්දි 1 යි |
| 23. | 59704 | සවල් 1 යි |
| 24. | 59706 | සවල් 1 යි |
| 25. | 59707 | බාල්දි 1 යි |
| 26. | 59795 | බාල්දි 1 යි |
| 27. | 59796 | බාල්දි 1 යි |
| 28. | 59914 | සුදුපාට බාල්දි 1 යි |
| 29. | 60268 | බාල්දි 1 යි |
| 30. | 60271 | බාල්දි 1 යි |
| 31. | 60343 | බාල්දි 1 යි |
| 32. | 60344 | බාල්දි 1 යි |
| 33. | 60792 | ඇලුමිනියම් කලගෙඩි 1 යි |
| 34. | 60985 | බාල්දි 1 යි |
| 35. | 60987 | බාල්දි 1 යි |
| 36. | 61691 | බාල්දි 1 යි/සවල් 1 යි |
| 37. | 61692 | බාල්දි 1 යි |
| 38. | 61693 | බාල්දි 1 යි |
| 39. | 62737 | බාල්දි 1 යි |
| 40. | 62762 | බාල්දි 2 යි |
| 41. | 62768 | සවල් 1 යි |
| 42. | 62272 | බාල්දි 1 යි |
| 43. | 62273 | බාල්දි 1 යි |
| 44. | 62378 | බාල්දි 1 යි |
| 45. | 63813 | බයින්ඩින් කම්බි සහිත පාර්සල් 1යි |
| 46. | 64494 | 6 x 6 (අගල්) බිත්ති මාබල්කැට 1 යි |
| 47. | 64495 | 25w බල්බ් 1 යි |
| 48. | 64496 | සිංගර් ඔයිල් කෑන් 1 යි |
| 49. | 64497 | විදුලි ටෝස්ටර් 1 යි |
| 50. | 58085 | ළමා සෙරෙප්පු ජෝඩුවක් |
| 51. | පොල් ගෙඩි 200 ක පමන තොගයක් | |
| 52. | විවිධ ප්‍රමාණයේ කෑන් 50 යි | |
| 53. | හිස් බෝතල් 500 ක පමණ තොගයක් | |
| 54. | බෝතල් ඇසුරුම් 10 යි | |
| 55. | යකඩ බැරල් 15යි | |
| 56. | අබලි යකඩ බැරල් 07 යි | |

04-179

## ආණ්ඩුවේ නොවන දැන්වීම්

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

මහනුවර, කටුගස්තොට පාරේ අංක 373/14 හි පදිංචි හේවගේ අනුර ප්‍රනාන්දු වන මා විසින් නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් අජිත් රොහාන් ධර්මප්‍රේම මහතා විසින් ලියා සහතික කරන ලද අංක 4236 හා 2000 අගෝස්තු මස 31 වැනි දින දරන ඇටර්නි බල පත්‍රය මගින් මහනුවර, කටුගස්තොට පාරේ අංක 273/14 දරන ස්ථානයේ පදිංචි දිල්හානි කුමාරිකා දුනුවිල බුල්ජැන්ස් යන අයට බලය පවරන ලද, ඇටර්නි බලපත්‍ර පොත් 8 බාණ්ඩයේ 188 පත්ඉරුවේ හා දිනපොත් අංක 816 හා 2000.10.25 දාතම ලියා පදිංචි කරන ලද ඇටර්නි බලපත්‍රය වර්ෂ 2007ක් වූ පෙබරවාරි මස 25 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට, අහෝසිකොට අවලංගු කරනු ලබන අතර, එකී ඇටර්නි බලකාර දිල්හානි කුමාරිකා දුනුවිල බුල්ජැන්ස් යන අය විසින් මින් ඉදිරියට මගේ ඇටර්නි බලකරු වශයෙන් කරනු ලබන කිසිම කටයුත්තකට මා විසින් වගකියනු නොලැබෙන පරිදි එකී ඇටර්නි බලපත්‍රය අහෝසිකොට අවලංගු කර සිටින බව ශ්‍රී ලංකාවාසී ජනතාවටත්, ශ්‍රී ලංකා ජනරජයටත් මෙයින් දන්වා සිටිමි.

හේවගේ අනුර ප්‍රනාන්දු.

වර්ෂ 2007ක් වූ පෙබරවාරි මස 10 වැනි දින දී ය.

04-187

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

බොරලැස්ගමුව, කනත්ත පාර, අංක 7 ඒ දරන තැන පදිංචි තිත්තගල්ල ගමගේ අසන්ග සමන්ත නැමැති මම, මා විසින් වතුමුල්ලගේ ප්‍රේමලතා ප්‍රනාන්දුට බලය පවරන ලද ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. ජයවීර සහතික කරන ලද අංක 216 සහ 2006.08.25 දින දරන ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ටී. ජී. අසංග සමන්ත.

2007 මාර්තු මස 26 වැනි දින දීය.

04-166

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගම්පහ බෞද්ධාලෝක මාවතේ, අංක 81 දරන ස්ථානයේ පදිංචි හීන්කෙන්ද මුදලිගේ සේවියර් හෙන්රි සිරිවර්ධන වන මා විසින් උඩුගම්පල, කිරිඳිවිට පාරේ, අංක 31 ජී හි පදිංචි හීන්කෙන්ද මුදලිගේ සුනිල් පුෂ්ප කුමාර සිරිවර්ධන මහතාට දී ඇති තිස්ස ගුණවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් තැන සහතික කළ 2006.04.01 වැනි දින හා අංක 2766 දරන ඇටෝර්නි බලපත්‍රය අද සිට අවලංගු කර ඇති බවත්, එකී ඇටෝර්නි බලකරු විසින් එම ඇටෝර්නි බලපත්‍රය යටතේ අද දිනට පසුව කරනු ලබන කිසිදු ක්‍රියාවකට හෝ ඇතුලත් වන කිසිදු ගණුදෙනුවකට මා වග නොකියන බවත් ය. ශ්‍රී ලංකා ජනරජය හා මහජනතාවගේ දැන ගැනීම පිණිස මෙයින් දන්වා සිටිනු ලැබේ.

එච්. එම්. එස්. එච්. සිරිවර්ධන.

2007 මාර්තු මස 30 වැනි දින දීය,

04-285

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය: 18/53508/ඉසඩ් 18/787.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ 2006.09.01 දින *ගැසට් පත්‍රයේ* සහ 2006.10.10 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනී ම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය කොළඹ 12, අලුත්කඩේ වීදිය, අංක 186/2 හි බලයලත් වෙන්දේසිකාර කේ. පී. එන්. සිල්වා මහතා විසින් එම දේපල පිහිටි ස්ථානයේදී 2007.05.12 වැනි දින පෙරවරු 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### ඉහත සඳහන් උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇලබඩගම පිහිටි උඩකියමුල්ලවත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. බී. අබේකෝන් විසින් සකසන ලද 1986.12.28 දිනැති හා අංක 946/86 දරන මිණුම් පිඹුරේ කැබලි අංක බී ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් පිළිවෙලින් පර්. 24ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

තවද, එකී මිණුම් පිඹුරේ කැබලි අංක 190 මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක එල් 113/100 හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

අංක 269, ගාලු පාර,
කොළඹ 3,
2007 මාර්තු මස 30 වැනි දින.

04-278/1

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය: 19/56636/ඉසඩ්19/378.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ 2006.09.01 දින *ගැසට් පත්‍රයේ* සහ 2006.11.13 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනී ම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය කොළඹ 12, අලුත්කඩේ වීදිය, අංක 186/2 හි බලයලත්

වෙන්දේසිකාර කේ. පී. එන්. සිල්වා මහතා විසින් එම දේපල පිහිටි ස්ථානයේදී 2007.05.12 වැනි දින පස්වරු 3.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

පුත්තලම දිස්ත්‍රික්කයේ, මුන්දලම උප දිසාපති කොට්ඨාශයේ පුත්තලම මදුරන්කුලිය ප්‍රාදේශීය සභා සීමාවේ සෙම්බැට්ටේ පිහිටි සෙන්දිසේනායි කඩු *හෙවත්* සෙම්බැට්ටේ කඩු නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. තිවේන්ද්‍රන් විසින් සකසන ලද 1994.12.24 දිනැති හා අංක 1506 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 2 රූ. 0 පර්. 0 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක ජී 4/268 හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

අංක 269, ගාලු පාර,
කොළඹ 3,
2007 මාර්තු මස 30 වැනි දින.

04-278/3

---

## සීමාසහිත සෙලාන් බැංකුව - ඇඹිලිපිටිය ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න කෝරළේ දියපොතගම් පත්තුවේ පනාමුර ගමේ පිහිටි ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඊ. වීරරත්න විසින් සහතික කරන ලද 1978.08.21 දිනැති අංක 575 දරන ඔප්පුවේ සඳහන් වූ ද බලයලත් මිනින්දෝරු ඩී. ඩබ්ලිව්. ගුණරත්න විසින් වලංගු කරන ලද 1968.12.23 දිනැති අංක 1642 දරන සැලැස්මේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කරනු ලබන වෙලමැදවාඩිය වත්ත යනුවෙන් හඳුන්වනු ලබන සහ දන්නා බෙදාවෙන් කරන ලද ඉඩම. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ජී 50/133 යටතේ ලියාපදිංචි කර ඇත. ප්‍රමාණය අ. 2, රූ. 0 පර්. 16 විශාල ඉඩම.

ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඊ. වීරරත්න විසින් සහතික කරන ලද්දාවූ ද සීමාසහිත සෙලාන් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 2000 ජූලි මස 7 දිනැති අංක 9474 දරන බැදුම්කරය මත මුදල් ගෙවීම ඇඹිලිපිටිය පදිංචි අබේවික්‍රම ලියන ආරච්චිගේ ගුණදාස සහ බුලත්සිංහලගේ සුමිත්‍රා පෙරේරා යන අය පැහැර ඇති හෙයින්, සීමාසහිත සෙලාන් බැංකුව විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාරව, 2007ක් වූ මැයි මස 22 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2004.06.03 වැනි දින "ඩේලිනිව්ස්" "දිනමිණ" සහ "තිනකරන්" පුවත්පත් මෙන්ම 2004.06.25 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද බලන්න.

*දේපලට පිවිසීම.–* ඇඹිලිපිටිය සිට කොලොන්න පාරේ. කි. මී. 10 පමණ ගිය විට පාතමුරේ හන්දිය හමුවේ. එතැනින් දකුණට හැරී වැල්ලකුඹුර පාරේ මීටර් 500 පමණ ගොස් වැල්ලකුඹුර පාලම ළඟින් දකුණට ඇති ගුරු පාරට හැරී මීටර් 500 පමණ ගිය විට අදාළ දේපළ හමු වේ.

*ගෙවීමේ ක්‍රමය.–* විකිණීම ස්ථිර කළ වහාම සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලූ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුයි :

1. ගැණුම් මිළෙන් සියයට දහයක් (10%),
2. ගැණුම් මිළෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළදී සීමාසහිත සෙලාන් බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කල යුතුය,
3. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (01%),
4. වෙන්දේසි කරුගේ වෘත්තිය ගාස්තු තීන්දු වූ මිළෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
5. බැංකුව විසින් දරන ලද සියළුම ප්‍රචාරක සහ අනෙකුත් වියදම් වල වටිනාකමින් 50%,
6. ලිපිකරු හා සෝෂක වේතන රු. 500,
7. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති සීමාසහිත සෙලාන් බැංකුව, සෙලින්කෝ සෙලාන් ටවර්ස්, අංක 90, ගාලු පාර, කොළඹ 3.

දුරකථන 011- 2456291, 011-4701291.

ත්‍රිවංක සී. සේනානායක,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
සහ උසාවි කොමසාරිස්.

කොළඹ වාණිජ මහාධිකරණය,
සහ දිසා අධිකරණය, බලයලත් වෙන්දේසිකරු රාජ්‍ය සහ වාණිජ බැංකු
අංක 182, පළමු මහල, උසාවිය පාර, කොළඹ 12.

දුරකථන අංකය: 011-2388318.
ෆැක්ස් අංකය: 011-2445393.

04-277

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - ගාල්ල ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ප්‍රසිද්ධ නොතාරිස් ඒ එම්. එස් මරික්කාර් විසින් සහතික කරන ලද්දාවූ ද, 1997.01.22 දින සහ අංක 6982 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කාරියවසම් තන්තිරිගේ ආරියපාල ණයකරු හැටියට පැහැර ඇති හෙයින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව විසින් මා වෙත පවරන ලද බලතල යටතේ අයවිය යුතු ණය මුදල් සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත විස්තර කරන ලද දේපළ 2007 අප්‍රේල් මස 27 දින පෙ. ව. 11ට දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ අලුත්වල පිහිටා ඇති හර්මන් එස්ටේට් නමින් හැඳින්වෙන ඉඩමට බලයලත් මානක ඩබ්. පී. ඩී. යූ. කරුණාරත්න විසින් පිළියෙල කරන ලද අංක 2256 සහ 1996 ඔක්තෝබර් මස 10 වැනි දින දරන බෙදුම් පිඹුර ප්‍රකාරව එහි ඩී 2 දරන කැබැල්ලෙන් බෙදා වෙන්කළ ඩී 2$^{2}$ දරන කැබැල්ල ලෙස මැන බෙදා වෙන්කොට සලකුණු කොට ඇති ඉඩම විශාලත්වය අක්කර 3 යි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදන සඳහා 2005.11.11 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2005.11.16 වැනි දින දරන දිවයින, අයිලන්ඩ්, තිනකරන් යන පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.–* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු වේ.

ගැණුම් මිළෙන් 10%ක් ද, (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි) වැට් බද්ද ද, වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්) නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිළෙන් ඉතිරි 90% (සියයට අනූව) විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත දී සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට ගෙවා නිමකළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමණාකරු (ණය අධීක්ෂණ හා අයකර ගැනීමේ දෙපාර්තමේන්තුව) සීමාසහිත හැටන් නැෂනල් බැංකුව අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංකඃ 2661815, 2661816.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකයඃ 2863121.

04-260/1

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - ගල්කිස්ස ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දාවූ ද 2004.02.27 වැනි දින සහ අංක 2002 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. ටී. ධර්මතිලක විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දාවූ 2004.12.14 දින සහ අංක 1122 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අප්පයියා තවබාලචන්ද්‍රන් සහ උමරාණි තවබාලචන්ද්‍රන් ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර පහත සඳහන් දේපල පිහිටි ස්ථානයේදී 2007 අප්‍රේල් මස 30 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ නගර සභාව තුළ සල්පිටි කෝරළේ, පල්ලේපත්තුවේ, වෝඩ් 47, වැල්ලවත්ත දකුනේ පිහිටි සහ වරිපනම් අංක 52 මුවර්ස් පාරේ පිහිටි මහා වැල්ලවත්ත නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක එස්. ක්‍රිෂ්ණපිල්ලේ විසින් 2003.02.18 වැනි දින මැන සාදන ලද අංක 1613 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 6411 සහ 6412 දරන ඉඩම් කැබලි හා ඒ තුළ ඇති ගොඩනැගිලි ආදී සියලු දේත් සමග වේ.

විශාලත්වය ලොට් අංක 6411– පර්චස් 22.85
ලොට් අංක 6412 – පර්චස් 2.15

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.03.23 දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2007.04.03 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500)ක් ද,
5. සියලුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහ (රු. 2,000) ක් ද වේ.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුලත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අදාල ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු කළමණාකරු, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය: 2863121.

04-260/2

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - මිනුවන්ගොඩ ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසිය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහ නගර සභා සීමාව තුළ 3 වන කුරණ පරාක්‍රම පාරේ පිහිටි මාදන්ගහවතු කැබැල්ල නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එල්. කෲස් දාබරේරා විසින් 1991 මැයි මස 29 වැනි දින මැන සාදන ලද අංක 5692/1991 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන සහ බලයලත් මානක ඩබ්ලිව්. ජේ. එම්. ජේ. ඩයස් විසින් 2002 අගෝස්තු මස 13 වැනි දින මැන සකස් කරන ලද අංක 2954 දරන මැතක දී කරන ලද මැනුම අනුව පර්චස් 30 විශාලැති ඉඩම් කැබැල්ල.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කිව්. ටී. තිසේරා විසින් සහතික කරන ලද්දාවූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමට ලියන ලද්දාවූ ද 2003.08.06 වැනි දින සහ 3484 දරන බැඳුම්කරය සහ 3485 දරන ලිඛිතය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගුත්තිල පිණ්ඩික කාරියකරවන ණයකරු හැටියට පැහැර ඇති බැවින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් කළ දේපල වර්ෂ 2007 මැයි මස 04 වැනි දින පෙරවරු 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2007.02.15 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රයද*, 2007.02.27 වැනි දින ද අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් යන පුවත් පත්‍ද බලන්න.

ගෙවීමේ ක්‍රමය.– වෙන්දේසිය අවසන් වූ විගස ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේ ම වෙන්දේසිකරු වෙත ගෙවා සිටිය යුතුය. (1) ගැණුම් මිලෙන් 10%ක් ද, (2) පලාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, (4) රු. 55,000 නොවැඩි වෙන්දේසි වියදම් වලින් 50%ක් ද (5) ලිපිකරු හා ගෝෂක ගාස්තු වශයෙන් රු. 500ක් ද (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 2,000ක් ද වේ. ගැණුම් මිලේ ඉතිරි මුදල වන 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩිදුර විස්තර සඳහා විමසන්න. කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, පිහිටි එච්එන්බී ටවර් හි 18 වන මහලේ පිහිටි නීති අංශයේ කළමණාකරු නීති (අයකිරීම්) දුරකථන අංක: 2661815 හෝ 2661819.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134,
බැද්දගාන පාර, කෝට්ටේ.
දුරකථන අංකය: 2873656, ෆැක්ස්: 2871184, ජංගම: 0777-672082.

04-266

---

## රුහුණ සංවර්ධන බැංකුව – ඌරුබොක්ක ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රුහුණු සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපල 2007.05.10 දින පෙ. ව. 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උකස්කර ඇති දේපල පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරලේ රොටුඹ නැමැති ගමේ පිහිටි මුගුණහේන නමැති රජයේ ඉඩමේ බෙදා වෙන්කළ අංක ජේ දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි පහයි හයක් (හෙ.0.256) ක් විශාල ඉඩම වේ.

වැඩි විස්තර සඳහා 2006.11.10 දිනැති *රජයේ ගැසට් පත්‍රය* ද 2007.02.17 දින දිනමිණ, තිනකරන් හා දි අයිලන්ඩ් යන පුවත්පත් වලද පළ කර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– පස්ගොඩ සිට රොටුඹ පාරේ සැතපුම් 04ක් පමණ ගියවිට ඌරව හන්දිය හමුවේ. එතැනින් දකුණු පසට වැටී ඇති බෙන්කන්දැලිය පාරේ සැ. 4/3ක් පමණ ගිය විට දකුණට වැටී ඇති පාරේ. මී. 75ක් පමණ ගියවිට එම පාරේ දකුණු පස මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය.

01. ගැණුම් මිළෙන් 25%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිළෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් 2 1/2%ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිළෙන් ඉතිරි 75%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුලත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ අංක 382 ඒ, දරන ස්ථානයේ පිහිටි රුහුණ සංවර්ධන බැංකුවේ , ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යාධිකාරී මහතාට ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත අදාළ මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිළෙන් ගෙවා ඇති 25%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041-2231532, 2226208, 2226209.

ජී. පී. ආනන්ද,
සාමවිනිසුරු,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත, වල්ගම,
මාතර.
දුරකථන අංක : 041-2228731.

04-181/1

---

## රුහුණ සංවර්ධන බැංකුව –අක්මීමන ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපල 2007.05.07 දින පෙ. ව. 11.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උකස්කර ඇති දේපල පිළිබඳ විස්තරය

ගාල්ල කඩවත් සතර තුළ මුලන බටහිර නරාවල පිහිටි ලොට් අංක 68 දරන මුලනහේන නමැති හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි පහයි බිංදුවක් (හෙ. 0.050) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි හා ගොඩනැගිලිද වේ.

වැඩි විස්තර සඳහා 2004.08.06 දිනැති *රජයේ ගැසට් පත්‍රය* ද 2005.12.23 දින දිනමිණ, තිනකරන් හා දි අයිලන්ඩ් යන පුවත්පත් වලද පළ කර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– ගාල්ල, මාපලගම පාරේ, බෝගහ හන්දියෙන් හැරී පෝද්දල පාරේ කි. මී. 2 1/2ක් පමණ ගියවිට හමුවන කොහවනාදෙනිය පාලම පසුකරනවාත් සමග වම්පසට වැටී ඇති මුලන පාරේ මීටර් 500ක් පමණ දුරින් මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය.

01. ගැණුම් මිළෙන් 25%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිළෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් 2 1/2%ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද වේ.

ගැණුම් මිළෙන් ඉතිරි 75%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුලත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ අංක 382 ඒ, දරන ස්ථානයේ පිහිටි රුහුණ සංවර්ධන බැංකුවේ , ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යාධිකාරී මහතාට ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත අදාළ මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිළෙන් ගෙවා ඇති 25%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041-2231532, 2226208, 2226209.

ජී. පී. ආනන්ද,
සාමවිනිසුරු,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත, වල්ගම,
මාතර.
දුරකථන අංක: 041-2228731.

04-181/2

## මහජන බැංකුව - හගුරන්කෙත ශාඛාව

1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැටේ, හේවාවිස්ස කෝරළේ, හේවාවිස්සේ ගබඩාගම පිහිටි බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක මහතා විසින් 1999.09.05 වන දින මැන සාදන ලද අංක 7690 දරණ පිඹුරේ සඳහන් අංක 02 දරන අක්. 0, රූ.0, පර්. 27.2 ක් විශාල ඉඩම සහ එහි තුල පිහිටි ගොඩනැගිල්ල මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය මත අප විසින් 2007.05.17 වන දින පෙ.ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ පිහිටි ස්ථානයේදී විසින් විකුණනු ලැබේ.

රජයේ *ගැසට් පත්‍රයේ* 2006.10.13 වන දින ද, දිනමිණ /ඩේලි නිවුස් සහ තිනකරන් යන පුවත්පත්වල 2006.09.29 වන දින ද පලකර ඇති දේපල වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.*– මහනුවර සිට කි. මී. 21 ක් පමණ මාරස්සන නගරය දක්වා ගමන්කර දකුණට ඇති පස්ගම පාරේ හේවාවිස්ස පාසැල දක්වා ගමන් කල පසු ඒ අසල පාරෙන් දකුණු පස ඉහත දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල ගෙවීම් කළ යුතුය ;

1. ගැණුම් මිලෙන් 10% ;
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ;
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ;
4. ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රු. 500 ක් ;
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ;

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුලත මහජන බැංකුව මහනුවර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 081-2234283 ෆැක්ස් : 081-2223017

නිමිකම් ඔප්පු හා වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බලයලත් වෙන්දේසිකරුවෝ
(රාජ්‍ය හා පෞද්ගලික බැංකුකරුවන් වෙනුවෙන්
සහ උසාවි කොමසාරිස්වරු)

*ප්‍රධාන කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය* :
අංක 24, ටොරින්ටන් පාර, මහනුවර,
*දුරකථන අංකය* : 081-2224371/ 081-2227593,
*ෆැක්ස් අංකය* : 081-2224371.

*නව නාගරික කාර්යාලය සහ වෙන්දේසි ශාලාව* :
අංක 290, හැව්ලොක් පාර, කොළඹ 05.
*දුරකථන අංකය* : 011-2585408/011-2502680,
*දුරකථන අංකය* : 011-2588176
*ඊ-මේල්* samera@srilankanet

04-253

B6–B 079479

## මහජන බැංකුව - නාත්තන්ඩිය ශාඛාව

1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

ඉහළ හත්තිනිය පිහිටි නිවසක් සහිත වටිනා දේපළ, විශාලත්වය පර්චස් 39.50කි.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.04.24 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

රජයේ *ගැසට් පත්‍රයේ* ...... දින ද, දිනමිණ පුවත්පතේ 2007.03.09 දින ද, ඩේලිනිව්ස් පුවත්පතේ 2007.03.09 දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.*– නාත්තන්ඩිය වලහපිටිය මාර්ගයේ පුංචි පාලම හන්දියෙන් වමට ඇති මරඳ පාරේ සැතපුම් 03ක් පමණ ගිය තැන මරඳ මහින්දාරාමය පංසල ඉදිරිපිට පාරේ වම්පස මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු,
7. ගැණුම් මිලෙන් ඉතිරි 90 ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත නාත්තන්ඩියේ පිහිටි මහජන බැංකුව, හලාවත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක 032-2253301, ෆැක්ස් අංක 032-2255247 032-2253300

නිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුලත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු
හා උසාවි කොමසාරිස්.

අංක 22, ප්‍රනාන්දු පාර, මීගමුව.
දුරකථන අංක : 031-2223219.

04-281/1

## මහජන බැංකුව - හලාවත ශාඛාව

### 1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

හලාවත, වැල්ල පිහිටි නිවසක් සහිත වටිනා දේපළ, විශාලත්වය (හෙක්ටයාර් 0.0168).

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.05.04 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2002.12.27 දින ද, දිනමිණ පුවත්පතේ 2003.03.05 දින ද, ඩේලිනිව්ස් පුවත්පතේ 2003.03.05 දින ද, තිනකරන් පුවත් පතේ 2003.03.05 වැනි දින ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.–* හලාවත තානායම අසලින් වැල්ල පල්ලිය දෙසට යන මාර්ගයේ වැල්ල පල්ලියට කිට්ටුවෙන් කලපුව දෙසට ගමන් කළ හැකි කුඩා අතුරු පාරක් හමුවේ. එම පාරේ මීටර් 10ක් පමණ යනවිට දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිළෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පලාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වේතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු,
   ගැණුම් මිළෙන් ඉතිරි 90 ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත නාත්තන්ඩියේ පිහිටි මහජන බැංකුව, හලාවත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක 032-2253300, ෆැක්ස් අංක 032-2255247
032-2253301

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුලත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු
හා උසාවි කොමසාරිස්.

අංක 22, ප්‍රනාන්දු පාර, මීගමුව.
දුරකථන අංක : 031-2223219.

04-281/2

## මහජන බැංකුව - පළමු නගර ශාඛාව

### 1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරලේ, රාගම් පත්තුවේ, වත්තල -මාබෝල නගර සහා සීමාව ඇතුළත පිහිටි "දෙල්ගහවත්ත" නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. ජී. ගුණතිලක විසින් සාදන ලද අංක 1573 දරන පිඹුරේ ලොට් "ඒ" වශයෙන් ලකුණු කොට නිරූපිත (මීගමු පාරේ) වරිපනම් අංක 716, 716 ඒ සහ 716 බී දරන ප්‍රමාණයෙන් අක්. 0 රූඩ් 0 පර්. 3.55ක් වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ බිම් කොටස එහි පිහිටි ගොඩනැගිල්ල සමග (මීගමු පාරේ) කලින් වරිපනම් අංක 698 සහ 698 ඒ වූ දැනට වරිපනම් අංක 716, 716ඒ සහ 716බී දරන අඩි 30ක් පළල අඩි 45ක් දිග බිම් කොටස එහි පිහිටි ගොඩනැගිල්ල සමග මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය පරිදි මා විසින් 2007 අප්‍රේල් මස 28 වැනිදා සෙනසුරාදා පෙ. ව. 11.00 ට ආරම්භව පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.–* සාර්ථක ගැණුම්කරු විසින් මිල තීන්දු වූ වහාම පහත සඳහන් ගාස්තු මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිළෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු දේශීය අලෙවි බද්ද 1% (සියයට එක),
3. විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්) වන වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු රු. 500,
5. විකුණුම් පිරිවැය හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා,
6. අලෙවි සහතිකය සඳහා මුද්දර ගාස්තු,
7. ගැණුම් මිළෙන් ඉතිරි 90% (සියයට අනූව) වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත කොළඹ 1 ආදිපාද වීදියේ අංක 11 හි මහජන බැංකුව කලාප කාර්යාලය (බස්නාහිර පළාත 01) සහකාර සාමාන්‍යාධිකාරී වෙත ගෙවිය යුතුය.

දූරකථන අංක 2344985 ෆැක්ස් අංකය 2435977.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැකිය. එකී මුදල ඉහත දක්වා ඇති පරිදි දින 30ක් ඇතුලත ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවා ඇති 10% මුදල රාජසන්තක කොට දේපල විකිණීමේ අයිතිය බැංකුව සතුය.

ඩන්ස්ටන් කෙලාට්,
උසාවි කොමසාරිස් සහ බ්‍රෝකර්, රජයේ
සහතිකලත් විශේෂඥ වෙන්දේසිකරු, තක්සේරුකරු
සහ දේපල නියෝජිත.

අංක 42, දුටුගැමුණු වීදිය,
පාමන්කඩ, දෙහිවල.
දුරකථන අංක : 2814743
දුරකථන/ෆැක්ස් අංකය : 2814742, 2814744
ක්ෂණික ඇමතුම් : 077-2250422.

04-280

## සීමාසහිත සෙලාන් බැංකුව - මහනුවර ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

(1) මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ දැන් මහනුවර මහ නගර සභා සීමාව තුල යටිනුවර ගඟවට කෝරලේ කලින් ග්‍රෙගරි පාර, රජපිහිල්ල මාවත පිහිටි බලයලත් මිනින්දෝරු සී. ඩී. ආදිහෙට්ටි විසින් සාදන ලද 1995 ඔක්තෝබර් 25 දිනැති අංක 1938 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දැන් රාජපිහිල්ල මාවත වරිපනම් අංක 185 ඒ දරන කැබලි අංක 1 ලකුණු කල (මහනුවර රාජපිහිල්ල මාවත වරිපනම් අංක 81 දරන ඉඩම සහ පරිශ්‍රයෙහි කොටසක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම සහ පරිශ්‍රය තුල පර්චස් දහයක් (අ.0,රූ. 0, පර්. 10) විශාල ගොඩනැගිල්ල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියළු දේ සමග ඉඩම. මෙය මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත් ඉරුව ඒ 273/246 යටතේ ලියාපදිංචි කර ඇත.

(2) මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ සහ දැන් මහනුවර මහ නගර සභා සීමාව තුල යටිනුවර ගඟවට කෝරලේ කලින් ග්‍රෙගරි පාර දැන් රාජපිහිල්ල මාවත සහ අම්පිටිය වෝඩ් අංක 14 හි පිහිටි මහනුවර බලයලත් මිනින්දෝරු සී. යූ. පාලමකුඹුර විසින් සාදන ලද 1998 මැයි 28 දිනැති අංක 3634 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කැබලි අංක 1 ලකුණු කල (රොක්විලා *නොහොත්* රොක්හවුස් හි බෙදූ කොටසක් වන සහ බලයලත් මිනින්දෝරු ආර්. ජේ. සමරසිංහ විසින් සාදන ලද 1992.09.18 දිනැති අංක 20 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 1 හි කොටසක් වන පරිශ්‍රය සහ අංක 464 බී දරන සැලැස්මේ සඳහන් පුද්ගලික පාර දිගේ වෙන් කිරීමක් සේ පෙන්නුම් කරනු ලබන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම එකයි දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 1.125) විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ඒ 295/225 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම දේපල කලුතර අංක එන් (පී. වී. එස්.) 15449 යටතේ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුල සංස්ථාපිත සමාගමක් වන දේශානි ඩ්‍රෙස් පොයින්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන බන්ධනදායී වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව සුරක්ෂිත කර ඇත. යෝජනා සම්මුති දැන්වීම 2006.12.29 වන දින *රජයේ ගැසට් පත්‍රයේද* 2006.12.08 දින ඩේලිමිරර් සහ ලංකාදීප පුවත්පත් වල ද 2006.12.22 වන දින වීරකේසරි පුවත්පතේ ද පළ වී ඇත.

ඉහත සඳහන් දේපල 2007 මැයි මස 08 වන දින පෙ. ව. 11.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙනදේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.–* නුවර නගරයේ සිට බෝට් හවුස් ඔස්සේ සංඝරාජ මාවතේ කෙලවර (රජින හෝටලය ඉදිරිපිට) හා රජපිහිල්ල මාවත (මේස් පාර්ක් කෙළවර) ඔස්සේ මීටර් 750 ක් පැමිණි විට අදාල දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය .–* සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය.

1. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්) 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1% ක් වන පළාත් අධිකාරී බද්ධ (සියයට එකක්) 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්) 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිම කළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නීති) සීමාසහිත සෙලාන් බැංකුව, අංක 90, ගාලු පාර, කොළඹ 03. දු. ක. 011-2456284, 2456263, 2456285

තුසිත කරුණාරත්න,
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස් තක්සේරුකරු.

ටී. ඇන්. එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව,
දු. අ. 011 -2696155, 011-2572940

04-270

---

## සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කරනු ලබන විකිණීමයි

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හිරියාල හත්පත්තුවේ, හැටහයේ කෝරලේ, මැදමුල්ලේ පිහිටි බලයලත් මානක එම්. ගුණසේකර විසින් සාදන ලද වර්ෂ 1991 ක් වූ සැප්තැම්බර් මස 7 වන දිනැති අංක 130/91 දරන පිඹුරේ ලොට් 9 වශයෙන් බෙදා වෙන් කොට සළකුණු කොට දැක්වෙන හපුදහන කොටුව ඉඩම සහ අනුබද්ධ කුඹුර ඉඩමෙන් Kumbura බෙදා වෙන් කරන ලද ප්‍රමාණයෙන්, අ. 0, රූ. 0, පර්. 20 වන ඉඩම් කොටස, එහි පිහිටි දේපල සහ සියළුම දේ සහ අදලා මාර්ග අයිතිය ද සමග කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එස්. ඉහලගම විසින් සහතික කරන ලද්දාවූ සී/ස නේෂන්ස් ට්‍රස්ට් බැංකුව නමට ලියන ලද්දා වූ ද 2003 මැයි මස 02 වන දිනැති අංක 10489 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම මැල්සිරිපුර, දඹුල්ල පාර, අංක 9 හි පදිංචි සෙනෙවිරත්න හොටෙල්හි කැකුල් තොටුවගේ දොන් බර්නාඩ් සිරිලාල් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් සීමා සහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් අප වෙත පවරා ඇති බලය ප්‍රකාරව 2007 ක් වූ මැයි මස 23 වන දින පෙ.ව. 10.00ට ඉහත සඳහන් දේපල අප විසින් එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2007.01.26 වන දින *රජයේ ගැසට් පත්‍රයද* 2007.01.10 වන දින දිවයින, ද අයිලන්ඩ් සහ තිනකරන් පුවත්පත්ද බලන්න.

*දේපලට පිවිසීම.–* කුරුණෑගල නගර මධ්‍යයේ සිට දඹුල්ල ප්‍රධාන පාරේ කිලෝමීටර් 25 පමණ ගමන් කළ විට මැල්සිරිපුර හන්දිය හමුවේ. එතැන් සිට දඹුල්ල ප්‍රධාන පාරේ මීටර් 300 පැමිණ මදහාපොල ප්‍රධාන පාර ඔස්සේ මීටර් 200 පමණ ගිය විට වමට බොරළු පාරක් හමුවේ. එතැන් සිට මීටර් 75 ගිය විට අදාල ඉඩමට ප්‍රවේශ විය හැක.

*ගෙවීම් කල යුතු ආකාරය .–* විකිණීම ස්ථිර කල වහාම සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලූ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුයි.

01. ගැනුම් මිළෙන් සියයට දහයක් (10%),

02. ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනුව 90% විකිණීමේ දින සිට දින 30 ක් තුලදී සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතුය.
03. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%)
04. වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු තීන්දු වූ මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%)
05. බැංකුව විසින් දරන ලද සියළුම ප්‍රචාරන සහ අනෙකුත් වියදම්
06. ලිපිකරු හා සෝෂක වේතන රු. 500
07. නොතාරිස් ගාස්තු විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000

හිමිකම් ඔප්පු පරීක්ෂාව සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. කළමනාකරු - නීති, සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව - අංක 242 යුනියන් පෙදෙස කොළඹ 02.
දුරකථන 011- 4313131

ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවෝ,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ, සහ
උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණය සහ දිසා
අධිකරණය, බලයලත් වෙන්දේසිකරුවෝ
රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 182, පළමු මහළ, උසාවිය පාර, කොළඹ 12,
දුරකථන/ෆැක්ස් : 011 2388318

04-275

---

## සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කරනු ලබන විකිණීමයි

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර, ගඟ පළාතේ පැලව (යහලතැන්න) හි පිහිටි බලයලත් මානක ජේ. සී. එස්. මිස්සෝ විසින් සාදන ලද වර්ෂ 1939 ක් වූ සැප්තැම්බර් මස 16 වන දිනැති අංක 1083 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් බෙදා වෙන් කොට සළකුණු කොට දැක්වෙන මානවහේන ඉඩමෙන් (Mnawehena) බෙදා වෙන් කරන ලද ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, පර්. 21 වන ඉඩම් කොටස එහි පිහිටි ගොඩනැගිලි සමග සියළු දේ බලයලත් මානක ටී. බී. අත්තනායක විසින් මෑතකදී සාදන ලද වර්ෂ 1995 ක් වූ ජනවාරි මස 5 වන දිනැති අංක 4839 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන පැලව යහලතැන්න හි පිහිටි මානවහේන ඉඩමෙන් (Mnawehena) බෙදා වෙන් කරන ලද ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, පර්. 21, 1/3 වන ඉඩම් කොටස එහි පිහිටි ගොඩනැගිලි සමග සියළු දේ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. අෂීස් විසින් සහතික කරන ලද 1992 ඔක්තෝම්බර් මස 19 වන දිනැති අංක 8552 දරන ඔප්පුව පරිදි දරන සහ හිමිව සිටින ප්‍රමාණයන් සමග, කුරුණෑගල ප්‍රදසිද්ධ නොතාරිස් ඒ. එස්. ඉහලගම විසින් සහතික කරන ලද්දා වූ සී/ස නේෂන්ස් ට්‍රස්ට් බැංකුව නමට ලියන ලද්දා වූ ද 2003 අගෝස්තු මස 20 වන දිනැති අංක 10576 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කුරුණෑගල, බෝධිරාජ මාවත අංක 25, ස්ථානයේ සිටිසන් හාඩ්වෙයාර් හි සහ අංක 285, යහලතැන්න, මහනුවර හි පදිංචි සිද්දදෙණිය මුහන්දිරමලාගෙදර මොහොමඩ් ලෙබ්බේ මොහොමඩ් රාසික් යන අය පැහැර හැර ඇති හෙයින් සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් අප වෙත පවරා ඇති බලය ප්‍රකාරව 2007 ක් වූ මැයි මස 21 වන දින පෙ.ව. 11. 00 ට ඉහත සඳහන් දේපල අප විසින් එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2007.01.26 වන දින *රජයේ ගැසට් පත්‍රයද* 2007.01.11 වන දින දිවයින ද අයිලන්ඩ් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

දේපලට පිවිසීම .– නුවර ටවුමේ සිට කටුගස්තොට තෙක් ගමන් කර කටුගස්තොටු බසාර් වෙතින් කුරුණෑගල පාරට හැර කිලෝමීටර් 6.6 පමණ ගමන් කළ විට අලදෙණිය බසාර් එක හමුවේ. අලදෙණිය ටවුමෙන් වමට ඇති මුරුතලාව පාරේ කිලෝමීටර් 2.4 ගමන් කළ විට යහලතැන්න හංදිය හමුවේ එතැනින් වමට හැරී යහලතැන්න පාරේ මීටර් 250 පමණ ගමන් කළ විට මෙකී ඉඩමට ප්‍රවේශ විය හැක.

*ගෙවීම් කළ යුතු ආකාරය* .– විකිණීම ස්ථිර කළ වහාම සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලූ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුයි.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%)
2. ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනුව 90% විකිණීමේ දින සිට දින 30 ක් තුලදී සී/ස නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතුය.
3. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%)
4. වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු තීන්දු වූ මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%)
5. බැංකුව විසින් දරන ලද සියළුම ප්‍රචාරන සහ අනෙකුත් වියදම්
6. ලිපිකරු හා සෝෂක වේතන රු. 500
7. නොතාරිස් ගාස්තු විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවෝ
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ,
සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණය
සහ දිසා අධිකරණය, බලයලත්
වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැකු

අංක 182, පළමු මහළ, උසාවිය පාර, කොළඹ 12
දුරකථන/ෆැක්ස් 011 2388318

කළමනාකරු - නීති, සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව-
අංක 242 යුනියන් පෙදෙස කොළඹ 02.
දුරකථන 011-4313131

04-276

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.